# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

**COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION**

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.

දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045

වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


2026.07.08 **මාධ්‍ය නිවේදන අංක 2026/076**

ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**<u>හිටපු කැබිනට් අමාත්‍යවරයෙකු වූ ආරුකට්ටු පටබැඳිගේ ජගත් පුෂ්පකුමාර යන අය දූෂණ චෝදනා මත අත්අඩංගුවට .</u>**

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ හිටපු කැබිනට් අමාත්‍යවරයෙකු වූ ආරුකට්ටු පටබැඳිගේ ජගත් පුෂ්පකුමාර යන අය දූෂණ චෝදනා මත 2026.07.08 වන දින පෙ.ව.9.20ට පමණ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලද අතර, අදාළ දූෂණ චෝදනා පහත පරිදි වේ.

I. 2014 ඌව පළාත් සභා මැතිවරණයට ප්‍රකාශයට පත් කර තිබිය දී රජයේ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට පෝස්ටර් අත්පත්‍රිකා 250000ක් මුද්‍රණය කිරීම සඳහා හලාවත වැවිලි සමාගමට හා කුරුණෑගල වැවිලි සමාගමට විධාන කිරීමෙන් ඒ සඳහා අදාළ සමාගම් දෙකට රු.2,665,000/- ක මුදලක් වැය කිරීමට කටයුතු කරවීම

II. 2015 ජනාධිපතිවරණ කාල සීමාව තුළ ගංවතුර ආධාර ලෙස සරම් ටී-ෂර්ට් සහිත ඇඳුම් කට්ටල 5000ක් හා සාය හැට්ටය සහිත ඇඳුම් කට්ටල 5000ක් බෙදා දීම සඳහා හලාවත වැවිලි සමාගමෙන් හා කුරුණෑගල වැවිලි සමාගමෙන් නිසි ක්‍රමවේදයෙන් තොරව මිල දී ගැනීම හරහා එම සමාගම් දෙකට රු.3,275,000/- ක් හා රු.3,075,000/-ක් හා භෞතිකව බෙදා නොදීම

III. 2013 හා 2014 මැයි පෙළපාලි සහභාගී වන්නන්ට හලාවත වැවිලි සමාගමෙන් ටී ෂර්ට් 2000ක් හා සාරි 1500ක් බැගින් හා කුරුණෑගල වැවිලි සමාගමෙන් ටී ෂර්ට් 2000ක් හා සාරි 1500ක් බැගින් ලබා දීමට නිලධාරීන් පෙළඹවීම

අත්අඩංගුවට ගන්නා ලද ඉහත සැකකරු කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව